{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்

# Department of Education – North Central Province

## අ.පො.ස.(උ/පෙළ) අවසාන වාර පරීක්ෂණය - 2025

ශ්‍රේණිය 13

## ගිණුම්කරණය - 33

I පත්‍රය

කාලය :පැය 2 යි

පාසලේ නම :- ..........................................................................................

ඇතුළත්වීමේ අංකය :-

* අංක 1 සිට 30 තෙක් වු ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත** ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම සමාන **ලකුණු** හිමිවේ.
* **ඔබගේ නම** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි. | |
|---|---|
| I පත්‍රය සඳහා | |
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

1. LKAS 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශනවල අරමුණ වන්නේ
   (1) ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන්ට ආර්ථික තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම
   (2) ව්‍යාපාරයක කාර්යක්ෂතාවය ඇගයීම සඳහා තීරණ ගන්නා පාර්ශවයන්ට අවශ්‍ය තොරතුරු සැපයීම
   (3) ව්‍යාපාර ඒකකයක වර්තමාන හා විභව ආයෝජකයින්ට සහ ණය සැපයූ පාර්ශවයන්ට එම ව්‍යාපාර ඒකකයට සම්පත් සැපයීම සම්බන්ධයෙන් තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.
   (4) ව්‍යාපාර ඒකකයක මූල්‍ය තත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු තීරණ ගැනීම සඳහා අවශ්‍ය පාර්ශ්වයන්ට සැපයීම.
   (5) නෛතික අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා සහ බදු ගණනය කිරීම සඳහ අවශ්‍ය තොරතුරු සැපයීම. (……)

2. ''කල්පන'' ව්‍යාපාරය තම ගනුදෙනු වාර්ථා කිරීමේ දී දැරිය යුතු ශ්‍රම පිරිවැය ඉහළ යාම නිසා එම කාර්ය සඳහා විශේෂයෙන් සංවර්ධනය කරන ලද පරිගණක මෘදුකාංගයක් ද මිල දී ගෙන ස්ථාපිත කර ඇත.
   (1) තාක්ෂණික පරිසරය
   (2) ආර්ථික පරිසරය
   (3) සමාජ හා සංස්කෘතික පරිසරය
   (4) ශිල්පීය හා වෘත්තීය පරිසරය
   (5) නෛතික පරිසරය (……)

3. කල්බදු යටතේ මිල දී ගත් වත්කමක නෛතික අයිතිය වත්කම මිලදී ගත් අවස්ථාවේ ගැනුම්කරු සතු නොවූව ද ගැනුම්කරුගේ ගිණුම් පොත්වල මෙය වත්කමක් ලෙස හඳුනා ගැනීමට අදාලවන ගිණුම්කරණ සංකල්පය වන්නේ,
   (1) මූල්‍ය මිනුම් සංකල්පය
   (2) ඓතිහාසික පිරිවැය සංකල්පය
   (3) විචක්ෂණ සංකල්පය
   (4) යථාරූපී සංකල්පය
   (5) ගැලපුම් සංකල්පය (……)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

**4.** විකුණුම් ප්‍රවර්ධනය සඳහා සාම්පල් ලෙස බෙදාහරින ලද තොග අයිතම විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී ගැණුම්වලින් අඩු කිරීමට පදනම්වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) ගැලපුම් සංකල්පය
(2) සංගතතා සංකල්පය
(3) උපචිත සංකල්පය
(4) කාලච්ජේද සංකල්පය
(5) ඒකක සංකල්පය (……)

**පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 5 සහ 8 ට පිළිතුරු සපයන්න.**

2025.01.01 දින සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. 2025 ජනවාරි මාසයේ දී පහත ගනුදෙනු ව්‍යාපාරයේ සිදු වී ඇත. VAT අනුපාතය 18% කි.

| **අංකය** | **ගනුදෙනුව** |
|---|---|
| 1. | පිරිවැය රු. 300 000 ක් වූ භාණ්ඩ රු. 442 500 කට රුවිනිට ණයට විකිණීම (VAT ඇතුලත් අගය) |
| 2. | රු. 25 000 ක මුදල් වට්ටමක් ලබා දීමෙන් පසුව ලැබිය යුතු මුළු මුදල පියවීමට රුවිනිගෙන් චෙක්පතක් ලැබීම. |
| 3. | පිරිවැය රු. 200 000 ක් වූ භාණ්ඩ 20% ක ලාභ අධිකයක් යටතේ අත්පිට මුදලට විකිණීම (VAT රහිත අගය) |
| 4. | පිරිවැය රු. 400 000 ක් වූ භාණ්ඩ තොගයක් හසිනිගෙන් ණයට ගැනීම (VAT රහිත අගය) |
| 5. | හසිනිගෙන් ණයට ගත් රු. 59 000 තොග ආපසු යැවීම (VAT ඇතුළත් අගය) (……) |

**5.** ගනුදෙනු අංක 1 සහ 2 හි ශුද්ධ බලපෑම පමත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද ?

| | **වත්කම්** | **වගකීම්** | **හිමිකම** |
|---|---|---|---|
| (1) | 117 500 | 67 500 | 50 000 |
| (2) | 117 500 | | 117 500 |
| (3) | 50 000 | | 50 000 |
| (4) | 167 500 | 67 500 | 100 000 |
| (5) | 117 500 | 117 500 | |

(……)

**6.** ගනුදෙනු අංක 3,4 සහ 5 ඒවා සිදු වූ අනුපිළිවෙල අනුව ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛන,

(1) ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, හර
(2) ලදුපත, ගෙවීම් වවුචරය, බැරපත
(3) ගෙවීම් වවුචරය, ඉන්වොයිසි, හරපත
(4) ඉන්වොයිසිය,ගෙවීම් වවුචරය, බැරපත
(5) ලදුපත, ඉන්වොයිසිය, හරපත (……)

**7.** ගනුදෙනු අංක 3 පොදු ලෙජරයට පිටපත් කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන කුමක් ද ?

| | | |
|---|---|---|
| 1. | ණයගැති පාලන ගිණුම හර | 283 500 |
| | විකුණුම් ගිනුම බැර | 283 500 |
| 2. | මුදල් ගිණුම හර | 283 200 |
| | විකුණුම් ගිනුම බැර | 240 000 |
| | VAT පාලනය ගිණුම බැර | 43 200 |
| 3. | මුදල් ගිණුම හර 283 500 | |
| | විකුණුම් ගිණුම බැර | 240 000 |
| 4. | ණයගැති පාලන ගිණුම හර | 283 000 |
| | විකුණුම් ගිණුම බැර | 240 000 |
| | VAT පාලන ගිණුම බැර | 43 200 |
| 5. | මුදල් ගිණුම හර | 240 000 |
| | විකුණුම් ගිණුම බැර | 240 000 |

(……)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

**8.** 2025.01.31 දිනට VAT පාලන ගිණුමේ ශේෂය කුමක් ද ?

(1) 56 700
(2) 39 000
(3) 67 500
(4) 47 700
(5) 111 000 (……)

**9.** අරුණ ව්‍යාපාරය 2025.03.01 දින 6% ක පොළී අනුපාතයකට රු. 100 000 ක ණයක් සේවකයෙකුට දුන් අතර ණය ලබා දීම නිවැරදිව ගිණුම් තබා ඇත. එහෙත් මාර්තු මාසයේ පොළීය රු. 500 ක් ඇතුළුව රු. 5 000 ක වාරිකය වැටුපෙන් අඩුකර ශුද්ධ වැටුප, වැටුප ගිණුමට හර කර මුදල් ගිණුමට බැර කිරීමට හැර වෙනත් සටහන් තබා නොමැත. මෙම වරද සහිතව ගණනය කරන ලද ශුද්ධ ලාභය රු. 40 000 ක් නම් වරද නිවැරදි කල පසු නිවැරදි ශුද්ධ ලාභය වන්නේ,

(1) රු. 35 000 (2) රු. 35 500 (3) රු. 5 500
(4) රු. 34 500 (5) රු. 45 500 (……)

**10.** මහි ව්‍යාපාරය සුළු මුදල් අග්‍රිම ක්‍රමයක් ක්‍රියාත්මක කරයි. අග්‍රිමය රු. 5 000 ක් වන අතර සෑම මසකම 1 සහ 15 යන දිනවල දෙවරක් අග්‍රිමය ප්‍රතිපූර්ණය කරනු ලැබේ. දෙවන ප්‍රතිපූර්ණය රු. 4 000 කි. 2025.03.01 දිනට සුළු මුදල් ශේෂය රු. 800 ක් වූ මාර්තු මාසයේ සුළු මුදල් ගෙවීම රු. 8600 කි. 2025.03.31 දිනට සුළු මුදල් ශේෂය වන්නේ,

(1) රු.5 000 (2) රු. 2 200 (3) රු. 400
(4) රු. 800 (5) රු. 8 600 (……)

**11.** 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනයට අනුව එහි ශුද්ධ ලාභය රු. 850 000 ක් විය. මෙම කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව පහත වැරදි අනාවරණය විය.

- ගැනුම් ජර්නලයේ එකතුව වූ රු. 1 200 000 පොදු ලෙජරයට රු. 2 100 000 ක් ලෙස පිටපත් කර තිබුණි.
- ගෙවිය යුතු පොලී රු. 450 000 ක් පොලී ආදායම් ගිණුමට බැර කර පොලී වියදම් ගිණුමට හර කර තිබුණි.
- රු. 275 000 බැංකු ණය වාරිකයක් ගෙවා තිබූ අතර එය බැංකු ණය ගිණුමට හර කර මුදල් ගිණුමට බැර කර තිබුනි. කෙසේ වුව ද මෙම වාරිකය තුළ ඇතුළත් වූ රු. 175 000 ක පොළී වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

ඉහත වැරදි නිවැරදි කළ පසු සමාගමේ ශුද්ධ ලාභය

(1) 850 000
(2) 1 750 000
(3) 1 300 000
(4) 1 125 000
(5) 1 175 000 (……)

**12.** සමන් ව්‍යාපාරයේ 2025 ජනවාරි මාසයේ ණයගැති ලැබීම් 80 000 කි.

ණය ගැති ලැබීම් ද ඇතුළුව මුදල් ගිණුමේ හර පැත්තේ එකතුව රු. 140 000
ණය ගැති ලැබීම් සහ අත්පිට විකුණුම් හැර වෙනත් මුදල් ලැබෙන මූලාශ්‍ර නොමැත.
2025.01.01 දිනට මුදල් ශේෂය රු. 15 000 විය.
ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය මාසය අවසන් වන විට රු. 12 000 කින් වැඩි වී ඇත.
ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගත යුතු විකුණුම් අගය වන්නේ,

(1) රු. 152 000 (2) රු. 125 000 (3) රු. 92 000
(4) රු. 80 000 (5). රු. 137 000 (……)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**13.** නිෂ්පාදන ව්‍යාපාරයක 2024.12.31 න් අවසන් වර්ෂයේ සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| | |
|---|---|
| පාරිභෝජනය කල අමු ද්‍රව්‍ය | රු. 215 000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | රු. 230 000 |
| ඍජු වැටුප් - විචල්‍ය | රු. 45 000 |
| - ස්ථාවර | රු. 70 000 |
| ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය | රු. 170 000 |
| ස්ථාවර පරිපාලන පොදු කාර්ය | රු. 120 000 |
| වර්ෂය තුල නිෂ්පාදනය කල ඒකක සංඛ්‍යාව | රු. 10 000 |

නිෂ්පාදන කල ඒකකයක විචල්‍ය පිරිවැය සහ ඒකකයක නිෂ්පාදන පිරිවැය නිවැරදිව දැක්වෙන්නේ,

| | ඒකකයක විචල්‍ය පිරිවැය (රු.) | ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 27.5 | 51.5 |
| (2) | 26 | 50 |
| (3) | 21.5 | 63.5 |
| (4) | 26 | 43 |
| (5) | 23 | 73 |

(……)

**14.** ව්‍යාපාරයක පොත් වලින් උපුටා ගත් පහත දැක්වෙන තොරතුරු ඔබ වෙත සපයා ඇත.
2024.04.01දිනට තොගය රුඃ 2 000
වර්ෂය තුළ ගැනුම් රුඃ 13 000
වර්ෂය තුළ විකුණුම් රුඃ 15 000
හදිසියේ ඇති වූ ගින්නක් නිසා අවසාන තොගය සම්පූර්ණයෙන් විනාශ විය. ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතය විකුණුම් මිලෙන් 20% කි. විනාශ වූ තොගයේ අගය වනුයේ,

(1) රුඃ 14 000 (2) රුඃ 12 000 (3) රුඃ 3 000
(4) රුඃ 3 000 (5) රුඃ 2 000 (……)

**15.** හවුල් ව්‍යාපාර ආඥා පනතේ 42 වගන්තිය හවුල් ව්‍යාපාර සඳහා අදාල වන්නේ පහත සඳහන් අවස්ථාවලින් කුමන අවස්ථාවට ද ?

(1) හවුල් ව්‍යාපාරවක ගිවිසුමක් නොමැති අවස්ථාවක ලාභය බෙදා හැරීම
(2) හවුල් කරුවෙකු ඉවත් වන විට කීර්තිනාමය ගණනය කිරීම
(3) හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමක දී හවුල් කරුවන් ප්‍රාග්ධනය සඳහා දායක වීම
(4) විශ්‍රාම ගිය හවුල්කරුවකුගේ හිමිකම ණය මුදලක් ලෙස රඳවා ගැනීමේ දී
(5) හවුල් කරුවෙකුට ලබා දුන් ණය මුදලක් නැවත අයකර ගැනීම. (……)

**පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 16 සහ 17 ට පිළිතුරු සපයන්න.**

තරුෂි සහ නෙත්මි ලාභ අලාභ 1:1 අනුපාතයට බෙදා ගන්නා ලදී. 2024.04.01 දින ලාභයෙන් 1/4 ක කොටසක් සඳහා ජීවනි නව හවුල්කරුවෙකු ලෙස ඇතුලත් විය. ජීවනි තම ප්‍රාග්ධනය සහ කීර්තිනාම කොටස ලෙස රු. 4 000 000 ක් ගෙන එන ලදී. 2024.04.01 දින ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 2 000 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

තරුෂි, නෙත්මි සහ ජීවනි සඳහා ප්‍රාග්ධනය පොළී 10% ක් ගෙවීමට ද ජීවනිට මාසිකව රු. 40 000 ක වැටුපක් ගෙවීමට ද එකඟ විය. වෙනත් කොන්දේසි හවුල් ගිවිසුමේ නොවීය. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 2 500 000 කි.
2024.04/01 දිනට පහත ශේෂ පැවතුණි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

| | ප්‍රාග්ධන ගිණුම (රු'000) | ජංගම ගිණුම (රු'000) |
|---|---|---|
| තරුෂි | 3 000 | 240 |
| නෙත්මි | 2 000 | 150 |

**16.** තරුෂි, නෙත්මි, සහ ජීවනි නව ලාභ අලාභ බෙදාගන්නා අනුපාතය පිලිවෙලින්,

(1) 1:1:2 (2) 2:2:1 (3) 3:2:1
(4) 3:1:1 (5) 3:3: (……)

**17.** 2025.03.31 දිනට තරුෂිගේ ජංගම ගිණුමේ ශේෂය,

(1) 1 200 000 (2) 985 000 (3) 895 000
(4) 945 000 (5) 885 000 (……)

**පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 18 සහ 19 ට පිළිතුරු සපයන්න.**

2025.03.31 න් අවසන් වර්ෂයේ සීමිත රංග පොදු සමාගමේ පහත තොරතුරු සපයා ඇත.

විකුණුම් රු. 3 200 000
විකුණුම් පිරිවැය රු. 1 200 000
පරිපාලන බෙදා හැරීමේ සහ මූල්‍ය පිරිවැය රු. 800 000
ප්‍රථම වරට ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇති වූ අතිරික්තය රු. 220 000

2024.03.31 න් අවසන් වර්ෂයේ ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කර රු. 200 000 ක අතිරික්තයක් ඇති වූ ගොඩනැගිල්ලක් නැවත ප්‍රවර්ථන වර්ෂය තුල ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇති වූ ඌණතාවය රු. 370 000

**18.** 2025.03.31 න් අවසන් වර්ෂයේ මුළු ආදායම වන්නේ,

(1) රු. 3 200 000 (2) රු. 220 000 (3) රු. 2 420 000
(4) රු. 1 250 000 (5) රු. 3 420 000 (……)

**19.** 2025.03.31 න් අවසන් වර්ෂයේ වියදම වන්නේ,

(1) රු. 1 200 000 (2) රු. 200 000 (3)රු. 800 000
(4) රු. 2 370 000 (5) රු. 2 170 000 (……)

**පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 20 සහ 21 ට පිලිතුරු සපයන්න.**

2025.03.31 න් වර්ෂයේ 2025.03.31 දිනත් මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. 2025.04.15 අතර පහත සිදුවීම් වී ඇත.

A). 2025.03.01 දින මිලදී ගත් යන්ත්‍රයක ගැනුම් මිල 2025.04.10 දින රු. 1 200 000 ක් ලෙස තීරණය විය. ගැනුම් මිල නොදත් හෙයින් 2025.03.31 දිනට මෙම යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශනවලට හඳුනා නොගෙන තිබු අතර යන්ත්‍ර 10% බැගින් පිරිවැය මත ක්ෂය කරනු ලැබේ.

B). 2025.03.01 දිනට පිරිවැය රු. 1 200 000 ක් වූ තොගයක් 2025.04.05 දින රු. 1 150 000 කට විකීණීම. මෙම තොගයේ ශුද්ධ උපලබ්ධි අගය 2025.03.31 දිනට රු. 1 180 000 ක් ලෙස ඇස්තමේන්තු කර ලාභයට ගලපා තිබුණි.

C). 2025.03.01 දිනට ධාරණ වටිනාකම රු. 1 500 000 වූ ආයෝජනවල අගය 2025 අප්‍රේල් 10 දිනය වන විට රු. 1 300 000 ට අඩුවීම.

**20.** ඉහත සිදුවීම්වලින් LKAS 10 ප්‍රමිතියට අනුව ගලපන සිදුවිම් වන්නේ කුමන සිදුවිම් ද ?

(1) A පමණි (2) B පමණි (3) A සහ B පමණි
(4) A,B සහ C (5) A, B සහ C යන කිසිවක් නොවේ. (……)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

**21.** 2025.03.31 න් අවසන් වර්ෂයේ ඉහත සිදුවීම් ගැලපීමට පෙර ලාභය රු. 2 500 000 ක් නම් 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ප්‍රසිද්ධ කරන මූල්‍ය ප්‍රකාශන තුල පෙන්නුම් කල යුතු ලාභය වන්නේ,

(1) රු. 2 490 000 (2) රු. 2 460 000 (3) රු. 2 350 000
(4) රු. 2 260 000 (5) රු. 2 130 000 (……)

**22.** 2024.04.01 දිනට යන්ත්‍රයක ධාරණ වටිනාකම රු. 160 000 ක් විය. මෙම යන්ත්‍රය 2022.04.01 දින මිල දී ගෙන තිබූ අතර එදින පහත ඇස්තමේන්තු කර තිබුණි.

- ඵලදායී ජීව කාලය - වර්ෂ 5
- සුන්බුන් අගය - රු. 25 000

2024.04.01 දින රු. 80 000 දරා මෙම යන්ත්‍රය නවීකරණය කර ඇත. නවීකරණයෙන් පසු පහත ඇස්තමේන්තු කර තිබුණි.

- ඉතිරි ඵලදායී ජීව කාලය - වර්ෂ 4
- සුන්බුන් අගය - රු. 40 000

2025.03.31 න් අවසන් වර්ෂයේ යන්ත්‍ර ක්ෂය සහ 2025.03.31 දිනට සමුච්චිත ක්ෂය වන්නේ,

| | **ක්ෂය (රු)** | **සමුච්චිත ක්ෂය (රු)** |
|---|---|---|
| (1) | 60 000 | 105 000 |
| (2) | 50 000 | 50 000 |
| (3) | 40 000 | 95 000 |
| (4) | 50 000 | 140 000 |
| (5) | 45 000 | 85 000 |

(……)

**23.** සීමිත අනුර පොදු සමාගම වර්ෂ 20 ක කාලයක සිට අවට පරිසරය පිරිසිදු කිරීම ස්වෙච්ඡාවෙන් සිදු කරමින් සිටී. සමාගමේ ගණකාධිකාරීවරයා පවසන පරිදි මේ සඳහා වර්ෂයකට රු. 100 000 ක පමණ වියදමක් දැරීමට සිදු වේ. මෙම භාවිතය පිළිබඳව පහත කුමන ගිණුම්කරණ ක්‍රියාමාර්ගය නිවැරදි වන්නේ ද යන්න තෝරන්න.

(1) කිසිදු වගකීමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත යුතු ය
(2) මෙය අසම්භාව්‍ය වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු ය.
(3) මෙය ඇස්තමේන්තුවක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු ය.
(4) මෙය ප්‍රතිපාදනයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීමක් කල යුතු ය.
(5) මෙය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල යුතු ය. (……)

**24. LKAS 08** (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතියට අනුව පහත දෑ අතුරින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ලෙස සැලකිය හැක්කේ කුමක් ද?

A. තොග අගය කිරීම සඳහා පිරිවැය සූත්‍රය භාවිතා කිරීම
B. දේපළ පිරියත හා උපකරණ හඳුනාගැනීමෙන් පසු මිණුම්කරණය සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කිරීම.
C. දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම සඳහා සරළ මාර්ග ක්‍රමය භාවිතා කිරීම.

(1) A පමණි (2) B පමණි (3) A සහ B පමණි.
(4) A,B සහ C (5) A,B සහ C යන කිසිවක් නොවේ (……)

**25.** 2024.04.01 දිනට සීමිත ආසිරි පොදු සමාගමේ හිමිකම පහත පරිදි විය.

| | | |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | - | රු. 1 000 000 |
| රඳවාගත් ඉපැයීම් | - | රු. 900 000 |
| ඉඩම් ප්‍රත්‍යාගණනය සංචිතය | - | රු. 150 000 |

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

- ලාභය රු. 330 000
- ඉඩම් ප්‍රත්‍යාගණනය ඌණතාවය 90 000
- අතුරු ලාභාංශ 160 000
- හිමිකම් නිකුතුව 400 000



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

2025.03.31 දිනට සමාගමේ හිමිකම සහ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ හිමිකමේ වෙනස වන්නේ,

| | **හිමිකම (රු)** | **හිමිකමේ වෙනස (රු)** |
|---|---|---|
| (1) | 2 050 000 | 170 000 |
| (2) | 2 530 000 | 480 000 |
| (3) | 2 050 000 | 570 000 |
| (4) | 2 530 000 | 640 000 |
| (5) | 2 570 000 | 400 000 |

(……)

**26.** මූල්‍ය ගිණුම්කරණය සහ කළමණාකරණය ගිණුම්කරණය අතර වෙනස්කමක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | **කලමණාකරණ ගිණුම්කරණය** | **මූල්‍ය ගිණුම්කරණය** |
|---|---|---|
| **1** | කළමණාකරුවන්ගේ අවශ්‍යතාවයක් මෙන්ම නීතිමය අවශ්‍යතාවයකි | නීතිමය අවශ්‍යතාවයක් පමණි. |
| **2** | කළමණාකරණ ගිණුම්කරණ ප්‍රමිති බලපායි | මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිති බලපායි |
| **3** | තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී තීරණයට අදාලවන තොරතුරු සපයයි. | වාර්ෂික වාර්තාවක් ලෙස ප්‍රසිද්ධ කළ හැකි තොරතුරු සියල්ල සපයයි. |
| **4** | වර්ෂයකට වරක් කළමණාකරුවන්ට තොරතුරු සපයයි. | වර්සයකට කීපවරක් වුවද සිය කළමණාකරුවන්ට පමණක් තොරතුරු සපයයි. |
| **5** | අතීත හා අනාගත තොරතුරු සපයයි. | වර්තමාන තොරතුරු පමණක් සපයයි. |

(……)

**27.** නිෂ්පාදනයේදී යොදා ගනු ලබන අමුද්‍රව්‍යයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| මාසික පරිභෝජනය (ඒකක) | 500 |
| ඒකක පිරිවැය (රු) | 30 |
| එක් ඇණවුමක පිරිවැය (රු) | 40 |
| ඒකකයක් පවත්වාගැනීම වාර්ෂික පිරිවැය, ඒකකයක පිරිවැයෙන් 10% | |

ඉහත තොරතුරු අනුව මෙම අමුද්‍රව්‍යයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) හා වර්ෂයක් තුල තොග ඇණවුම් වාර ගණන පිළිවෙළින්,

| | **EOQ ආර්ථික ඇණවුම් ප්‍රමාණය** | **ඇණවුම් වාර ගණන** |
|---|---|---|
| (1) | 283 | 12 |
| (2) | 300 | 20 |
| (3) | 300 | 40 |
| (4) | 400 | 12 |
| (5) | 400 | 15 |

(……)

**28.** යන්ත්‍ර පැය මත පොදු කාර්ය පිරිවැය අවශෝෂණ කරන ව්‍යාපාරයක් විසින් භාණ්ඩ ඒකක 400 ක් නිපද වූ අතර ඒකකයක පිරිවැය රු. 200 ක් ලෙස ගණන් බලා ඇත. සත්‍ය යන්ත්‍ර පැය සංඛ්‍යාව 50 කි. මුළු ප්‍රාථමික පිරිවැය රු. 60 000 කි. පොදු කාර්ය පිරිවැය අවශෝෂන අනුපාතය කුමක් ද ?

(1) ශ්‍රම පැයකට රු. 40 (2) යන්ත්‍ර පැයකට රු. 50 (3)ඒකකයකට රු. 50

(4) යන්ත්‍ර පැයකට රු. 400 (5) ශ්‍රම පැයකට රු. 400 (……)

**29.** මුළු විකුණුම් ඒකක 1 000 න් වැඩි කරන විට ලාභය රු. 40 000 න් වැඩි වේ. ආරක්ෂිත ආන්තිකය මුළු විකුණුම්වලින් 25% කි. වාර්ෂික තුල උපයා ඇති ලාභය රු. 200 000 කි.

ආරක්ෂිත ආන්තිකය සහ සමජේද ලක්ෂය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | **ආරක්ෂිත ආන්තිකය (ඒකක)** | **සමච්ජේද ලක්ෂය (ඒකක)** |
|---|---|---|
| (1) | 5 000 | 15 000 |
| (2) | 15 000 | 5 000 |
| (3) | 5 000 | 5 000 |
| (4) | 5 000 | 20 000 |
| (5) | 15 000 | 20 000 |

(……)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**30.** ආයෝජන ව්‍යාපෘතියක 15% ක අපේක්ෂිත පිරිවැයක් යටතේ මුදල් ප්‍රවාහයක් වට්ටම් ගණනය කළ ශුද්ධ වර්තමාන අගය + 100 000 ක් වේ. මෙම ව්‍යාපෘතියේ මූලික ආයෝජනය රු. 500 000 කි. මෙම ව්‍යාපෘතියට අදාල නිවැරදි පිළිතුර තෝරන්න.

(1) මෙම ව්‍යාපෘතියේ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය 20% කි.
(2) මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ 15 % කි.
(3) මෙම ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය වසර 5 කි.
(4) මෙම ව්‍යාපෘතියෙන් 15% ක් වූ ප්‍රාග්ධනයේ පිරිවැය ආවරණය කර ගන්නවාට අමතරව තවත් රු. 100 000 ක් ප්‍රතිලාභ ලෙස අපේක්ෂා කල හැක.
(5) මෙම ව්‍යාපෘතියේ ප්‍රාග්ධනයට 15%ක ප්‍රතිලාභයක් ලැබෙන නමුත් සාමාන්‍ය තත්ත්වය වන්නේ රු.100 000 ක ප්‍රතිලාභයක් පමණක් ලැබීමය.

**ලකුණු ……..*…….. =……….**

- **31 සහ 50 දක්වා ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු සපයන්න.**

**31.** පහත ප්‍රකාශ සත්‍ය නම් (T) ද අසත්‍ය නම් (F) ද ඒ ඉදිරියෙන් යොදන්න. (T / F)

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| **A.** ගිණුම්කරණය තොරතුරු පද්ධතියකි | …………… |
| **B.** ව්‍යාපාරයක සිදුවන සියලුම ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ යෙදවුම් ලෙස සලකයි | …………… |
| **C.** කළමණාකරණ ගිණුම්කරණයෙන් සපයන්නේ මූල්‍යමය තොරතුරු පමණි | …………… |
| **D.** සියළු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ උපචිත පදනමට ය | …………… |

**32.** ව්‍යාපාරයක 2024.04.01 දිනට සහ 2025.03.31 දිනට හිමිකම පිළිවෙලින් රු. 400 000 ක් සහ රු.900 000 ක් විය.

අයිතිකරුගේ ගැනිලි

- මුදල් ගැනිලි රු. 70 000
- භාණ්ඩ ගැනිලි රු. 40 000

මුදල් ගැනිලි පමණක් ගිණුම්ගත කර තිබුණි. අතිරේක ප්‍රාග්ධනය යෙදවීම රු. 22 000 කි.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ නිවැරදි ශුද්ධ ලාභය ගණනය වන්නේ, ………………..

**33.** පහත ගනුදෙනු වාර්තා කල යුතු ජ'නලය (උපයෝගි පොත) ලියන්න.

| **ගනුදෙනුව** | **ජ'නලය** |
|---|---|
| **A.** විකුණුම් අත්තිකාරම් මුදල් ලැබීම | ……………………………….. |
| **B.** ණය ගැතියන්ගෙන් බොල්ණය කපා හැරීම | ……………………………….. |
| **C.** අත්පිට භාණ්ඩ විකිනීම | ……………………………….. |
| **D.** ණය හිමියන් ව්‍යාපාරයෙන් පමා පොළි අය කිරීම | ……………………………….. |

**34.** රුසිරු ව්‍යාපාරයේ 2025.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 53 000 ක් වූ අතර එදිනට මුදල් ගිණුමේ ශේෂය ඊට වෙනස් විය. පසුව පහත හේතු හඳුනාගන්නා ලදී,

- 2025.03.31 දිනට ගෙවීමට ඉදිරිපත් වී නොමැති චෙක්පත් රු. 45 000
- ණයගැතියෙන් බැංකුවට සෘජුව ප්‍රේෂණය කල රු. 25 000 ක් මුදල් ගිණුමේ සටහන් වී නොමැත.
- රු. 55 000 ක තැම්පත් කල චෙක්පත් 2025.03.31 දින වන විට උපලබ්ධි වී නොමැත.
- ව්‍යාපාරයේ මුදල් ගිණුමේ බැර පැත්ත රු. 2 000 ක් වැඩියෙන් එකතු කර ඇත.

2025.03.31 දිනට මුදල් ගිණුමේ ගැලපිම් කිරිමට පෙර ශේෂය වන්නේ, ……………………………..



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers   Model Answers - Study Resources

**35. A** මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සඳහා පදනම් වන උපකල්පනය …………………………...….. වේ.

**B** පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා පිලියෙල කල යුතු ආයතනයක් ………………………………..….. ලෙස නිර්වචනය කෙරේ.

**C** මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනිම සඳහා භාවිත කරන ප්‍රධාන මිනුම්කරණ පදනම් දෙක නම් කරන්න.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

**36.** පහත එක් එක් අවස්ථාවලට අදාළ වන **ගිණුම්කරණ සංකල්පය** සඳහන් කරන්න.

| | |
|---|---|
| A. තොග මිනුම්කරණය සඳහා යොදාගත් පිරිවැය සූත්‍රය අඛණ්ඩව භාවිතා කිරීම | |
| B. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල වත්කම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම | |
| C. කලින් ලද ආදායම් වගකීමක් ලෙස හඳුනාගැනීම | |
| D. විකුනුම් පිරිවැය ගණනය කිරීම් දි හානි වූ තොගයේ පිරිවැය ගැනුම් වලින් ඉවත් කිරිම | |

**37.** ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත

- 2024.04.01 දිනට ලැබිය යුතු සාමාජික මුදල් රු.5 100
- 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලද සාමාජික මුදල රු.35 000
- 2025.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් රු.3 050
- 2025.03.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් රු.2 500

2024.04.01 දිනට ලැබිය යුතු සාමාජික මුදලින් රු.1 100 ක අගයක් ලියා හැරීමට තීරණය කරන ලදී. සාමාජික මුදල් හේතුවෙන් 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ අතිරික්තයට හෝ හිඟයට වන ශුද්ධ බලපෑම කොපමණ ද? …………………………

**38.** හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පහත ප්‍රකාශ **සත්‍ය(T) ද අසත්‍ය (F)ද** යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| **A**.හවුල්කරුවෙකු විශ්‍රාම යන අවස්ථාවේ දි ඔහුගේ හිමිකම අනිවාර්යයෙන් මුදලින් පියවිය යුතුය. | ……………. |
| **B**.හවුල්කරුවෙකු විසින් ලබා දී ඇති ණයක් සඳහා පොලියක් ලබා දිය හැකි වන්නේ එය හවුල් ව්‍යාපාර ගිවිසුමේ සඳහන් ව ඇත්නම් පමණි. | ……………. |
| **C**.හවුල් ආඥාපනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන්ට වේතනයකට හිමිකම් නැත | ……………. |
| **D**.ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හවුල්කරුවන්ට කිසිසේත් හිමිකම් නැත. | ……………. |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

● **ප්‍රශ්න අංක 39 සිට 40 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගි කරගන්න.**

2024.04.01 දින ආරම්භ කල හවුල් ව්‍යාපාරයේ අමල් සහ කමල් 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන ගිය අතර 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව පහත තොරතුරු සපයා ඇත.

- වාර්ෂිකව රු. 100 000 හා 60 000 ක වේතනයක් පිළිවෙළින් අමල් සහ කමල් හිමි වී ඇත.
- අමල් සහ කමල්ට පිළිවෙළින් රු. 60 000 ක හා රු. 40 000 ක අවසාන ලාභ කොටස් බෙදා තිබේ.
- 2025.03.25 දින ඉදිරි ගිණුම් වර්ෂයේ විකුණුම් සඳහා ලද අත්තිකාරම් මුදල් රු. 100 000 කමල් තම පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇත. මෙම ගනුදෙනුව සම්බන්ධ කිසිදු සටහනක් යොදා නැත.
- කළණ විසින් 2024.04.01 දින ව්‍යාපාරයට රු. 400 000 ක ණය මුදලක් සපයා තිබු අතර, ඒ සඳහා ගෙවිය යුතු 10 % වාර්ෂික පොලිය සම්බන්ධයෙන් වාර්තා කර නොමැත.

**39.** 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ හවුල් ව්‍යාපාරය උපයා ඇති ශුද්ධ ලාභය නිවැරදි වටිනාකම ..............................................................................................

**40.** ආරම්භක ශේෂයන් නොමැති බවට උපකල්පනය කරමින් 2025.03.31 දිනට අමල් සහ කමල්ගේ ජංගම ගිණුම් ශේෂයන් වන්නේ ,

අමල් රු. ..........................................

කමල් රු. ...........................................

**41.** පහත ප්‍රකාශ **සත්‍ය(T) ද අසත්‍ය (F)ද** යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| **A.** මූල්‍ය ගිණුම්කරණය මගින් ව්‍යාපාරයක අභ්‍යන්තර පාර්ශවයින්ට තොරතුරු සපයනු නොලැබේ. | ................ |
| **B.** 1995 අංක 15 දරණ ගිණුම්කරන හා විගණන ප්‍රමිති පනතට අනුව සෑම සීමා සහිත සමාගමක් විසින්ම ගිණුම්කරන ප්‍රමිත අනුගමනය කිරීම අනිවාර්ය වේ. | ................ |
| **C.** මූල්‍ය වාර්ථාකරණයේ සංකල්පනාත්මක රාමුව පොදු පරමාර්ථ මූල්‍ය වාර්ථා පිළියෙල කිරීමට පමණක් අදාල වේ. | ................ |
| **D.** ශ්‍රී ලංකාව තුල ගිණුම්කරණ ප්‍රමිත සංවර්ධනය කිරිමේ බලය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව සතු වේ. | ................ |

**42.** සීමිත නිමින පොදු සමාගමේ 2024.04.01 දිනට හිමිකම පහත පරිදි විය.

| | | |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (කොටසක් රු. 12 බැගින් නිකුත් කල) | - | රු. 600 000 |
| රඳවාගත් ඉපැයීම් | - | රු. 100 000 |

2025.03.31 දින 2024.04.01 දිනට තිබු සෑම සාමාන්‍ය කොටස් 8 කට 1 ක් සේ ලැබෙන පරිදි කොටසක් රු. 10 බැගින් රඳවාගත් ඉපැයීම් භාවිතා කර සංචිත ප්‍රාග්ධනිත කරන ලදී, සංචිත ප්‍රාග්ධනිත කිරීම නිසා සමාගමේ හිමිකම, ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ මුළු වත්කම්වලට ඇතිවන බලපෑම දක්වන්න.

| | **බලපෑම (අඩු වේ / වැඩි වේ / වෙනස් නොවේ )** | **අඩු වේ නම් හෝ වැඩි නම් එම වටිනාකම** |
|---|---|---|
| හිමිකම | .................................... | ..................................... |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | .................................... | ..................................... |
| මුළු වත්කම් | .................................... | ..................................... |

**43.** ව්‍යාපාරයක් 2024.11.01 දින රු. 500 000 ස්ථාවර තැන්පතුවක ආයෝජනය කල අතර වර්ෂයකට 15% ක බැගින් කාර්තුමය වශයෙන් කාර්තුව අවසානයේ පොලී ලැබීමට නියමිතය. පළමු කාර්තුවේ පොලීය නියමිත පරිදි 2025.01.31 දින ලැබී ඇත. පොලී උපචිත පදනමට ලාභයට හඳුනා ගැනේ. ඉහත ගනුදෙනු නිසා 2025.03.31 දිනෙන් අවසන් වර්සයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් සහ ආයෝජන කටයුතුවලට ඇති කරන ශුද්ධ බලපෑම වන්නේ,



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

**A.** මෙහෙයුම් කටයුතුවලට ඇති කරන ශුද්ධ බලපෑම වන්නේ ...................................
**B.** ආයෝජන කටයුතුවලට ඇති කරන ශුද්ධ බලපෑම වන්නේ .....................................

**44.** පහත සඳහන් තොරතුරු සමාගම් දෙකක 2025.03.31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අදාළ වේ.

| අනුපාතය | සීමිත P පොදු සමාගම | සීමිත Q පොදු සමාගම |
|---|---|---|
| ණය හිමිකම් | 1.5 | 0.8 |
| පොලී ආවරණ (වාර) | 2.5 | 3.2 |
| හිමිකම් මත ප්‍රතිලාභ | 25% | 20% |
| ක්ෂණික වත්කම් | 0.8:1 | 1.2:1 |

මෙම සමාගම් වලට අදාළව පහත දෑ සඳහන් කරන්න.

A - කොටස් හිමියන්ට වැඩි ප්‍රතිලාභයක් ජනනය කරන සමාගම .................
.

B - පොලී වියදම් ආවරණය කිරීමට ඉහළ හැකියාවක් ඇති සමාගම ..................

C - වත්කම් අත්පත් කරගැනීම සඳහා වැඩි ණය ප්‍රාග්ධනයක් භාවිත කරන සමාගම .................

D - කෙටිකාලීන බැඳීම් පියවීමට වැඩි හැකියාවක් ඇති සමාගම ..................

**45.** වෙනත් සාධක ස්ථාවරව තිබිය දී 2017.03.31 දිනට පහත එක් එක් ගනුදෙනුවක දී සමාගමක හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සහ ණය හිමිකම් අනුපාතය වැඩි වේ (I) ද, අඩු වේ (D) ද හෝ වෙනස් නොවේ (NC) ද යන්න සඳහන් කරන්න. (මෙම ගනුදෙනු 2017.03.31 දින සිදුවූ බව උපකල්පනය කරන්න.)

| ගනුදෙනුව | හිමිකම් ප්‍රතිලාභ අනුපාතය | ණය හිමිකම් අනුපාතය |
|---|---|---|
| A - 12% ක පොලී අනුපාතයකට බැංකුවකින් දිගුකාලීන ණයක් ලබාගැනීම | ..................... | ................... |
| B - හිමිකම් නිකුතුවක් කළ අතර දැනට සිටින කොටස්කරුවන් සියලුම හිමිකම් සඳහා දායක විය. | .................... | ................... |

**46.** එක්තරා ඇසුරුම් පෙට්ටි වර්ගයක් නිෂ්පාදන කරන භාතිය ව්‍යාපාරයේ ඒ සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය සම්බන්ධව පහත දත්තයන් අදාළ වේ.

| | |
|---|---|
| උපරිම ඇණවුම් කාලය | දින 6 |
| අවම ඇණවුම් කාලය | දින 2 |
| අවම භාවිතය දිනකට | 60kg |
| යලි ඇණවුම් ප්‍රමාණය (ඒකක ) | 500 |
| උපරිම තොග වට්ටම (ඒකක ) | 980 |

දිනකට අමුද්‍රව්‍ය උපරිම භාවිතය කොපමනද? ..................................................

**47.** පහත දී ඇති එක් එක් අරමුණට අදාළ මූලාශ්‍ර ලියකියවිලි නම් කරන්න.

| අරමුණ | මූලාශ්‍ර ලියවිල්ල |
|---|---|
| (1) ගබඩාව විසින් භාණ්ඩ ලද බව තහවුරු කිරීම. | .................. |
| (2) නිෂ්පාදන දෙපාර්තමේන්තුවක් විසින් අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය ගබඩාවට දැන්වීම. | .................. |
| (3) භාණ්ඩ ලබාදෙන ලෙස සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිම. | ................... |
| (4) විකුණුම් සිදු වී ඇති බව තහවුරු කිරිම. | ................... |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**48.** නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය යන්ත්‍ර පැයකට රු. 25 කි. කාලච්ඡේදයේ අයවැයගත නිෂ්පාදනය ඒකක 2000 ක් වුවත් සත්‍ය නිෂ්පාදනය ඒකක 1800 ක් විය. නිමි ඒකකයක් සඳහා ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන 4 ක් වුවත් ඒකකයක් නිපදවීමට යන්ත්‍ර පැය 3 ක් පමණක් ගත වී ඇත.

අයවැයගත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ අන්තර්ග්‍රහණය ලෙස නිෂ්පාදනය පොදු කාර්‍ය පිරිවැය වන්නේ,

A - අයවැය ගත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ……………………………………..

B - අන්තර්ග්‍රහනයට කල නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ……………………………………..

**49.** ඒකක. 1000 ක මට්ටමක දී ලාභ ප්‍රකාශනය පහත පරිදි දී ඇත.

| | |
|---|---|
| මුළු දායකය | රු. 25 000 |
| ස්ථාවර පිරිවැය | රු. (40 000) |
| අලාභය | රු. (15 000) |

ඒකකයක විචල්‍ය පිරිවැය රු. 15ක් නම් සමච්ඡේදනය වීමට කොතරම් වටිනාකමක විකුණුම් සිදුකල යුතුද?…………………………………………………………………………………………

**50.** ව්‍යාපාරයක් රු. 2 000 000 ක මූලික මුදලක් අවශ්‍ය වන ආයෝජනයක් සිදු කිරීමට අදහස් කරයි. මූලික මුදලින් 80% වහා දැරිය යුතු අතර ඉතිරිය පළමු වර්ෂය අග දැරීමට සිදු වේ. පළමු වර්ෂය තුල රු. 500 000 ක ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහයක් ජනනය වන අතර දෙවන වර්ෂයේ සිට වර්ෂ 5 දක්වා රු. 2 400 000 ක මුළු මෙහෙයුම් මුදල් ප්‍රවාහයක් ජනනය වේ. දෙවන වර්ෂයේ සිට වර්ෂ 5 දක්වා සමාන වාර්ෂික මුදල් ප්‍රවාහයක් ඇතිවන බව උපකල්පනය කරමින් ව්‍යාපෘතියේ පිලිගෙවුම් කාලය ගණනය කරන්න

…………………………………………………………………………………………………

***

**ලකුණු** [ ]



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்

# Department of Education – North Central Province

## අ.පො.ස.(උ/පෙළ) අවසාන වාර පරීක්ෂණය - 2025

ශ්‍රේණිය 13

ගිණුම්කරණය - 33

2 පත්‍රය

කාලය :පැය 3 වි. 10 යි

පාසලේ නම :- ..................................................................................................

ඇතුළත්වීමේ අංකය :- ..........................

**වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

* **පළමුවන හා දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

---

**1.** 2025.03.31 දිනට සීමිත මෙතුග පොදු සමාගමේ සාරංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර රු.'000 | බැර රු.'000 |
|---|---:|---:|
| දේපළ පිරියත හා උපකරණ | 6 980 | |
| වෙනත් ආදායම් | | 140 |
| වෙළෙඳ තොගය | 370 | |
| විකුණුම් | | 4 500 |
| සේවා අයභාරය | | 900 |
| විකුණුම් පිරිවැය | 440 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 700 | |
| මුදල් | 140 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 1 035 |
| බෙදා හැරීමේ පිරිවැය | 310 | |
| පරිපාලන වියදම් | 1 300 | |
| කල්බදු වාරික | 700 | |
| මූල්‍ය පිරිවැය | 185 | |
| බැංකු ණය | | 1 800 |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (රු. 10 බැගින්) | | 1 000 |
| 2024.04.01 දිනට ආදායම් බදු ප්‍රතිපාදන | | 60 |
| ගෙවූ බදු-2024/25 | 265 | |
| ලාභාංශ | 120 | |
| 2024.04.01 දිනට රඳවාගත් ඉපැයීම් | | 2070 |
| | **11 510** | **11 510** |

2025.03.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරිමේදි පහත තොරතුරු සැලකිල්ලට ගත යුතුය .



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(i) 2025.03.31 දිනට තොගයේ සංයුතිය පහත පරිදි විය.

| කාණ්ඩය | පිරිවැය රු. '000 | ශුද්ධ උපලබ්ධි අගය රු. '000 |
|---|---|---|
| A | 140 | 110 |
| B | 105 | 175 |
| C | 125 | 120 |

සමාගම කාණ්ඩ ක්‍රමයට අනුව තොගයේ ශුද්ධ උපලබ්ධි අගය තීරණය කරනු ලබයි.

(ii) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවූ අධක්‍ෂ ගාස්තුව රු. 120 000 ක් ඉහත පරිපාලන වියදම් තුල ඇතුලත් ය. 2025.03.31 ගෙවිය යුතු අධ්‍යක්‍ෂ ගාස්තුව රු. 25 000 කි. මෙය ගිණුම්ගත කර නැත.

(iii) 2025.03.31 අවසන් වර්ෂය සඳහා සිදු කල විගණනය සඳහා ගාස්තුව රු. 150 000 ක් ලෙස 2025.04.30 දින එකඟ වී එදින ගෙවා ඇත. මේ සඳහා කිසිදු සටහනක් ප්‍රවර්තන වර්ෂය තුල සිදු කර නැත.

(iv) ඉහත ශේෂ පිරික්සුමේ පවතින දේපළ පිරියත හා උපකරණවල සංයුතිය පහත පරිදි විය.

| | ඉඩම් | ගොඩනැගිලි | යන්ත්‍ර | එකතුව |
|---|---|---|---|---|
| 2024.04.01 දිනට ශේෂය | 3000 | 2000 | 1200 | 6200 |
| මිලදී ගැනීම් | 3000 | 2000 | 1500 | 1500 |
| ඉවත් කිරීම් | | | | |
| 2025.03.31 දිනට ශේෂය | 3000 | 2000 | 2700 | 7700 |
| සමුච්චිත ක්ෂය | | | | |
| 2024.04.01 දිනට ශේෂය | | 500 | 220 | 720 |
| වර්ෂයේ ක්ෂය | | | | |
| ඉවත් කිරීම් | | | | |
| 2025.03.31 දිනට ශේෂය | | 500 | 220 | 720 |
| 2025.03.31 දිනට ධාරණ අගය | 3000 | 1500 | 2480 | 6980 |

(v) යන්ත්‍ර මිලදී ගෙන ඇත්තේ 2025.01.01 දිනය. යන්ත්‍ර 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්‍ෂය කරනු ලැබේ.

(vi) 2024.04.01 දින සමාගම ගොඩනැගිලි දෙවන වතාවට රු. 1 700 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2023.04.01 දින ගොඩනැගිලි සිදුකල ප්‍රථම ප්‍රත්‍යාගණනයෙන් රු. 150 000 ඌණතාවයක් ඇති විය. 2024.04.01 දින ගොඩනැගිලිවල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 20 ක් ලෙසත් සුන්බුන් අගයක් නොමැති බවටත් ඇස්තමේන්තු කෙරිණි. 2024.04.01 දින සිදු කල ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් ගිණුම් පොත්වල සිදු කර නැත.

(vii) 2024.10.01 දින එදිනට ධාරණ වටිනාකම රු. 120 000 ක් සහ සමුච්චිත ක්‍ෂය රු. 130 000 ක් වූ යන්ත්‍රයක් රු. 80 000 කට විකුණා ඇත. විකිණීමෙන් ලද මුදල මුදල් සහ වෙනත් ආදායම්වල ඇතුලත් කිරීම හැර වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(viii) 2024.04.01 දින සමාගම සේවකයින් ප්‍රවාහනය කිරීම සඳහා මෝටර් රථයක් කල්බදු ක්‍රමයට අත්පත්කර ගන්නා ලද අතර එදින මූලික ගෙවීම ලෙස රු. 700 000 ක් ගෙවා එය කල්බදු වාරික ගිණුමට සටහන්කර ඇත. කල්බදු කාලය වර්ෂ 5 කි. පලමු වාර්ෂික කල්බදු වාරිකය වන රු. 500 000 ක් 2025.04.25 දින ගෙවා ඇත. පලමු සහ දෙවන වාරිකවල ඇතුලත් පොළී පිලිවෙලින් රු. 251 000 ක් සහ රු. 214 000 ක් වේ. 2024.04.01 දිනට කල්බදු ගෙවීම්වල වර්තමාන අගය රු. 1 650 000 කි.

කල්බදු කාලය අවසානයේ මෙම රථය සමාගමට හිමි වේ. මෙම රථයේ සුන්බුන් අගය රු.850000 ක් ලෙස සහ ඵලදායී ජීව කාලය වර්ෂ 8 ක් ලෙස ද ඇස්තමේන්තු කර ඇත.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ix) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බද්ධ රු. 310 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2023/2024 වර්ෂය සඳහා අවසන් වශයෙන් ගෙවූ රු. 55 000 ක් ඉහත වෙළඳ ගෙවිය යුතු දැවලට හර කර ඇත.

(x) 2025.02.01 දින 2025 මාර්තු සහ අප්‍රේල් මාසවලදී ගනුදෙනුකරුවෙකුට රු. 800 000 ක මුළු ප්‍රතිශ්ඨාවකට සේවාවක් සැපයීමක් වෙනුවෙන් රු. 300 000 ක මුදලක් අත්තිකාරමක් ලෙස ලැබිණි. 2025.03.31 දින වන විට මෙම සේවාවෙන් රු. 500 000 ක ප්‍රමාණයක් ඉටු කර ඇත. ලැබූ අත්තිකාරම මුදල් ගිණුමට හර කර විකුණුම් ගිනුමට බැර කිරීම හැර වෙනත් සටහන් තබා නැත.

(xi) 2025.03.25 දින සාමාන්‍ය කොටස් 100 000 ක් කොටසක් රු. 12 බැගින් නිකුත් කිරීමට සංස්ථා ප්‍රකාශයක් නිකුත් කල අතර 2025.03.31 වන විට කොටස් 120 000 ක් සඳහා අයදුම්පත් මුදල් ද සමඟ ලැබී ඇත. 2025.04.25 දින වැඩි පුර ලද කොටස් මුදල් ගෙවා ප්‍රතික්ෂේප කර කොටස් 100 000 ක් විභජනය කරන ලදී. මේ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් 2025.03.31 දිනට සිදු කර නොමැත.

(xii) 2025.03.31 දිනට පවතින බැංකු ණය ශේෂය සමාන මාස 36 කින් ගෙවා නිම කල යුතු ය.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත මෙතුග පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(මුළු ලකුණු 40 යි)**

**2. (අ)** නිෂ්පාදන ආයතනයක සේවක වැටුප් සම්බන්ධ තොරතුරු පහත වේ.

1. වැඩ කරන ලද පැය ගණන,

| **සේවකයා** | **සාමාන්‍ය පැය** | **අතිකාල පැය** |
|---|---|---|
| නිපුන් | 160 | 30 |
| තාරුක | 160 | 20 |
| කසුන් | 150 | - |

2. මාසයක සාමාන්‍ය පැය ගණන 160 ක් හෝ, එය ඉක්මවන විට රු. 5 000 ක දිරි දීමනාවක් මසකට ගෙවනු ලැබේ.

3. අතිකාල පැයකට සාමාන්‍ය පැයකට ගෙවීම මෙන් දෙගුණයක් ගෙවනු ලැබේ. අතිකාල පැයකට රු. 400 ක් ගෙවනු ලැබේ.

4. සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේව්‍ය හා සේවක දායකය පිළිවෙලින් 12% සහ 8% ක් වේ. සේවක භාරකාර අරමුදලට දායකය (ETF) 3% කි. EPF හා ETF ගණනය කිරීම සඳහා අතිකාල දීමනා හා දිරි දීමනා සැලකිල්ලට ගනු නොලැබේ.

5. සේවක වැටුපෙන් අඩු කිරීම් පහත වේ.

   වැටුප් අත්තිකාරම්

   නිපුන් රු. 7 000

   කසුන් රු. 4 000

6. යම් මාසයක වැටුප් ඊළඟ මාසයේ 10 දින ගෙවනු ලැබේ. EPF හා ETF දායකයන් ඊට පසු මාසයේ 15 දින ප්‍රේෂණය කරනු ලැබේ.

7. 2025.04.01 දිනට පහත ගිණුම් ශේෂ ලබා දී ඇත.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

ගෙවිය යුතු වැටුප් රු. 105 000
ගෙවිය යුතු EPF රු. 18 750
ගෙවිය යුතු ETF රු. 2 815

**අවශ්‍යවන්නේ,**

(1) 2025 අප්‍රේල් මාසය සඳහා වැටුප් ලේඛනය
(2) වැටුප් හා වේතන පාලන ගිණුම
(3) උපචිත EPF ගිණුම හා උපචිත ETF ගිණුම
(4) 2025 අප්‍රේල් මාසය සඳහා සේවකයන්ට අදාල මුළු වියදම

**( ලකුණු 18 යි)**

**(ආ)**අමාලි ආයතනය විවිධ වර්ගයේ මේස නිපදවා විකුණනු ලබයි. ආයතනයේ විවිධ දෙපාර්තමේන්තුවල වර්ෂයක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය හා අනෙකුත් තොරතුරු පහත දැක් වේ.

| | **නිමවුම්** | **පින්තාරු** | **ගබඩා** |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය - ලී (අඩියක් රු. 200 බැගින්) | 400,000 | - | - |
| සෘජු ද්‍රව්‍ය තීන්ත (ලීටරයක් රු. 300 බැගින් ) | - | 60,000 | - |
| සෘජු ශ්‍රමය (පැයකට රු. 250 බැගින්) | 100,000 | 125,000 | - |
| වක්‍ර ද්‍රව්‍ය | 31,000 | 37,000 | - |
| වක්‍ර ශ්‍රමය | 20,000 | 60,000 | 30,000 |
| යන්ත්‍ර පැය | 1,500 | 800 | 100 |

**වර්ෂයක් සඳහා ඇස්තමේන්තු ගත අනෙකුත් පොදු කාර්ය පිරිවැය** රු.

| | |
|---|---|
| සේවක සුහසාධන වියදම් | 50,000 |
| යන්ත්‍ර ක්ෂය | 600,000 |
| විදුලිය, ජලය සහ දුරකථන | 120,000 (බිම් ප්‍රමාණය මත විභජනය කල යුතු ය.) |

**අනෙකුත් තොරතුරු**

| | **නිමවුම්** | **පින්තාරු** | **ගබඩා** |
|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 21 | 27 | 2 |
| යන්ත්‍ර පිරිවැය රු.'000 | 4 000 | 1 500 | 500 |
| ගොඩනැගිලිවල බිම් ප්‍රමාණය (වර්ග අඩි) | 1 000 | 1 000 | 400 |

ගබඩාවේ පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර සමානව බෙදාහැරිය යුතුය.
ව්‍යාපාරය A නමින් එක්තරා වර්ගයක පුටුවක් නිෂ්පාදනය කරන අතර එම වර්ගයේ එක පුටුවක් නිපදවීම සඳහා පහත තොරතුරු සපයා තිබේ.

- නිමවුම් දෙපාර්තුමේන්තුවෙන් යන්ත්‍ර පැය 5 ක් අවශ්‍ය අතර ලී අඩි 30 ක් අවශ්‍ය වේ.
- පින්තාරු දෙපාර්තුමේන්තුවෙන් සෘජු ශ්‍රම පැය 5 ක් අවශ්‍ය අතර තීන්ත ලීටර් 4 ක් අවශ්‍ය වේ.

නිමැවුම් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මතද පින්තාරු දෙපාර්තමේන්තුව සෘජු ශ්‍රම පැය මත ද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.

**අවශ්‍යවන්නේ,**

(1) පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තුමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතය ගණනය කිරීම.
(3) A වර්ගයේ එක් පුටුවක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම.

**( ලකුණු 22 යි)**
**(මුළු ලකුණු 40 යි)**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**3.** **(අ)**පරිගණක සහ උපාංග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම සඳහා රුවන් විසින් 2025.04.01 දින ව්‍යාපාරයක් අරඹන ලදී. 2025.04.30 දිනෙන් අවසන් මාසය සඳහා මෙම ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත වේ. සියලුම මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කෙරේ.

1. ආරම්භක ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 800 000 ක් ද, රු. 3 000 000 ක් වටිනා ගොඩනැගිලි ද රු. 2 500 000 ක් වටිනා ලොරි රථය ද යොදවන ලදී.
2. රු. 1 500 000 ක් වටිනා පරිගණක හා උපාංග මිලදී ගන්නා ලද අතර ඒ සඳහා රු. 900 000 ක් මුදල් ගෙවන ලද අතර ඉතිරිය ණය පදනම මත වේ.
3. රුවන් ව්‍යාපාරයෙන් තම නිවසට ලබාගත් පරිගණකයේ පිරිවැය රු. 180 000 කි.
4. ගනුදෙනුකරුවන්ට පරිගණක උපාංග අලෙවියෙන් ලද මුදල රු. 400 000 ක් වූ අතර ඒ සඳහා භාවිතා කළ පරිගණකවල පිරිවැය රු. 180 000 ක් විය.
5. ව්‍යාපාරයේ මාසික විදුලි බිල රු. 5 000 ක් රුවන් විසින් පෞද්ගලික මුදලින් ගෙවන ලදී.
6. පරිගණක උපාංග සවිකිරීම වෙනුවෙන් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල රු. 250 000 ක් විය. ඒ සඳහා භාවිතා කළ උපාංග පිරිවැය රු. 100 000 කි.
7. 10% ක වට්ටම් අඩු කර ණයහිමියන්ට චෙක්පත් වලින් ගෙවූ මුදල රු. 270 000 කි.
8. පාසලකට නොමිලයේ ලබාදුන් පරිගණකවල පිරිවැය රු. 600 000 කි.
9. ව්‍යාපාරයේ මාසික දුරකථන බිල රු. 1 500 ක් වන එය මෙතෙක් ගෙවා නැත.
10. ණය හිමියන්ට ගෙවූ චෙක්පත්වලින් රු. 135 000 ක චෙක්පත් අගරු වී ඇත. ලද වට්ටම අහිමි කරන ලදී.
